# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1322 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 15/08/2024<br>පැය 0545 |

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කර සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.

2024.08.06 වන දින හංවැල්ල පොලිස් වසමේ තුම්මෝදර කුමාරි ඇල්ලට යන මාර්ගයේදී තියුණු ආයුධ වලින් කපා කොටා පුද්ගලයෙකු ඝාතනය කිරීමේ අපරාධය සම්බන්ධයෙන් බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් විමර්ශනයක් සිදුකර 2024.08.14 වන දින දහවල් පාදුක්ක පොලිස් වසමේ ගාලබැදිහේන ප්‍රදේශයේදී **අපරාධයට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන හංවැල්ල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 34 වයසේ පසුවන උඩුමුල්ල හා වටරැක ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අපරාධය සඳහා යොදා ගත් යතුරුපැදි 02 ක්ද පොලිසිය විසින් සොයා ගෙන ඇති අතර හංවැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.08.14 වන දින දහවල් කාලයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ඔරුගොඩවත්ත ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 02 ක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 150 මිලිග්‍රෑම් 600 ක් හා මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගත් බවට සැකපිට මුදල් රුපියල් 98,700/=ක් සමග සැකකරුවෙකුද, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 720 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකුද** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 35 හා 53 යන වයස්වල පසුවන ඕරුගොඩවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. හෙරොයින් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.08.14 වන දින සවස් කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ ධර්මපාල මාර්ගයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන පොල්ගස්ඕවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. හෙරොයින් සමග සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මාලිගාවත්ත පොලිස් ස්ථානය.**

2024.08.14 වන දින රාත්‍රී කාලයේදී මාලිගාවත්ත පොලිස් වසමේ ලක්සිත සෙවන හා මැල්වත්ත ප්‍රදේශවලදී මාලිගාවත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 02 ක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 ක් හා හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 600 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 48 හා 49 යන වයස්වල පසුවන මාලිගාවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මාලිගාවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. ගංජා සමග සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.08.14 වන දින රාත්‍රී කාලයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ස්ටේට්පුර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **ගංජා ග්‍රෑම් 101 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 53 ක් වන සිරිමාපුර, කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. නීති විරෝධී මත්පැන් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර කොට්ඨාස දූෂණ මර්ධන ඒකකය.**

2024.08.14 වන දින අළුයම් කාලයේදී කළුතර උතුර පොලිස් වසමේ ගල්පාත ප්‍රදේශයේදී කළුතර කොට්ඨාස දූෂණ මර්ධන ඒකකයේ නිලධාරීන්

කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 56 (බෝතල් 75)ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කළුතර උතුර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන පුන්සිරිපුර, ගල්පාත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කළුතර උතුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - මාතලේ පොලිස් වසම.

2024.08.14 වන දින සවස් කාලයේ මාතලේ පොලිස් වසමේ මාතලේ රත්තොට මාර්ගයේ සින්නකට්ටි කෝවිල අසලින් ඇති අතුරු මාර්ගයේ ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන බෑවුමකට පෙරලී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු මාතලේ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 56 ක් වූ කළුදෑවල, මාතලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාතලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මාතලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - මඩු පොලිස් වසම.

2024.08.14 වන දින රාත්‍රී කාලයේ මඩු පොලිස් වසමේ පූමලන්දාන් මඩු මාර්ගයේ පූමලාන්දාන් හන්දිය ප්‍රදේශයේදී පූමලන්දාන් දෙස සිට මඩු හන්දිය දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක ගමන් ගත් පුද්ගලයින් දෙදෙනෙකුගෙන් එක් අයෙකු ත්‍රීරෝද රථයෙන් මාර්ගයට වැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පුද්ගලයා මුරුක්කන් රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 47 ක් වූ සෝදිනගර්, පූමලන්දාන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මුරුන්කන් රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මඩු පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**